# මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022.11.14 දින පැවති මහා සභාවේ වාර්තාවයි.

2022.11.14 වන දින පෙ.ව 09.30 ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිතුමියගේ සභාපතිත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
අද දින සභා රැස්වීම සඳහා පැමිණ සිටින ඔබ සියළුම දෙනා ඉතාමත් ආදරයෙන් පිළිගන්නා අතර ආගම සිහි කිරීමෙන් අනතුරුව සභා කටයුතු ආරම්භ කර සිටිමු. අභාවප්‍රාප්ත ලෙනින් මදිනම් මැතිතුමා සිහිකිරීම පිණිස විනාඩියක කාලයක් නිශ්ශබ්ද තාවයෙන් ගෞරවය දක්වන ලෙසට ඉල්ලා සිටිමි.

## 01. පසුගිය සභා වාරයේ වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම සහ වාර්තාව සභා සම්මත කිරීම.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මීළඟට පසුගිය සභා වාරයේ වාර්තාව සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
පසුගිය මාසයේ මාගේ යෝජනාවන්ට අනුව යොමු කරන ලද ලිපිවල පිටපත් ලබා දෙන ලෙසට ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
පසුගිය සභා වාරයේ දී මා විසින් මාර්ග සංවර්ධන අධිකාරිය පිළිබඳව කාරණාවක් ඉදිරිපත් කර තිබුණා. නල්ලතන්නිය ප්‍රදේශයේ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරිය සතු ස්ථානයක පිහිටා තිබූ වෙළඳසැල් කිහිපයක් කඩා තිබෙනවා. කිහිපයක් කඩා නැහැ. ඔවුන්ටම ස්ථිර වශයෙන් ලබා දී තිබෙනවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
10 වන දින පැවති රැස්වීමකදී කඩන්නේ නැති බවට ප්‍රකාශ කර තිබෙනවා.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
කඩවල් 06 ක් දැනටමත් සම්පූර්ණයෙන්ම කඩා දමා තිබෙනවා. සමහර කඩවලට අවස්ථාවක් ලබා දී තිබෙනවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මෙම සිද්ධිය පිළිබඳව සොයා බලන ලෙසට මම කියන්නම්.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
දැනට නල්ලතන්නිය ප්‍රදේශයේ පස් කණ්ඩි ඉවත් කිරීමේ කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරමින් පවතිනවා. මෙය අගය කළ යුතු කාර්යයක්. එමෙන්ම  පසුගිය සභා වාරයේ දී අප විසින් ද සඳහන් කළ පරිදි ගරු මන්ත්‍රී සුරේෂ් කුමාර් මැතිතුමාද සඳහන් කර සිටියා කාපට් මාර්ග සඳහා ආරක්ෂක වැට ඉදිකිරීම පිළිබඳව. එනිසා ඒ පිළිබඳව ද සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ඉල්ලා සිටිමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මේ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා බදාදා දිනයේ පැමිණෙන බවට පවසා තිබෙනවා.

**ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)**
පසුගිය මාසයේ සභා වාර්තාව නිවැරදි බවට මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
එම යෝජනාව මා ස්ථිර කරමි.

**තීරණ අංක 01**
2022.10.12 දිනැති සභා වාර්තාව නිවැරදි හා සත්‍ය වාර්තාවක් බවට සභාව විසින් අනුමත කරන ලදී.

## 02. ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
පසුගිය අටවැනි දින පැවති ශ්‍රීපාද වන්දනා සමය ආරම්භ කිරීම පිළිබඳ විශේෂ සාකච්ඡාවේ දී මාර්ග සියල්ල ඉතාමත් අබලන් තත්වයට පත්වී ඇති බව අපි මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දුන්නා. මීළඟ පොහොය දිනට පෙර යම් තාක් දුරට මාර්ග අළුත්වැඩියා කරන බවට පවසා තිබෙනවා. ඒ සමගම මස්කෙළිය නගරයේ පිහිටි මාර්ග පද්ධතියේ අබලන් ස්ථාන හදුනාගෙන ඒවා වෙන් වෙන් වශයෙන් ඇස්තමේන්තු කර අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට සූදානම් කර තිබෙනවා.

## 03. සභාව වෙත ලැබී ඇති සංදේශ, පෙත්සම් සහ පැමිණිලි සභාවට ඉදිරිපත් කිරීම.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මීළඟට සභාවට ලැබී ඇති ලිපි සහ පැමිණිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

**ලිපි අංක 01**
යොමු කරන්නා - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය.
විෂය - 2022 අගොස්තු මස සහ සැප්තැම්බර් මස සභා වාර්තා නිරීක්ෂණ ලිපිය.

**ලිපි අංක 02**
යොමු කරන්නා - පාරිභෝගික සේවා අධිකාරිය.
විෂය - වැඩි මිලට භාණ්ඩ අලෙවි කිරීම පිළිබඳ වූ ලිපිය.

**ලිපි අංක 03**
යොමු කරන්නා - වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය.
විෂය - මහජනතාව පීඩාවට පත්ව ඇති විෂ සර්පයින් සහ වදුරු උවදුරු පිළිබඳ ලිපිය.

**ලිපි අංක 04**
යොමු කරන්නා - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස සහ ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය.
විෂය - රෝහල් වල පවතින අඩුපාඩු පිළිබඳ වූ ලිපිය.

**ලිපි අංක 05**
යොමු කරන්නා - මස්කෙළිය ප්‍රධාන වීදියේ දෙවන ලොරි රථ ගාලේ රියදුරන්.
විෂය - මස්කෙළිය ප්‍රධාන වීදියේ දෙවන ලොරි රථ ගාලේ රියදුරන්ගේ පැමිණිලි ලිපිය.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

මෙම සිද්ධිය ඇති වූ දිනයේ දී මමයි ගරු මන්ත්‍රී රවීන්ද්‍ර රාජා මැතිතුමයි එම ස්ථානයට ගොස් සිටියා. මෙම සිද්ධිය සම්බන්ධයෙන් ගරු සභාපති තුමියත් දැනුවත් කළා. අදාළ නිලධාරීන් දැනුවත් කර මේ සම්බන්ධයෙන් සොයාබැලීම් කරන බවට ගරු සභාපති තුමියත් පැවසුවා. ලේකම් තුමා ද දැනුවත් කර මේ සම්බන්ධයෙන් මම විමසුවා. අදාළ රියදුරන් අවුරුදු 20 ක් 30 ක් පමණ එම ස්ථානයේ තමන්ගේ වාහනය ගාල් කර ගෙන කටයුතු කරමින් තිබෙනවා. මේ සඳහා වූ සාක්ෂි ඒ අය ළග තිබෙනවා. දැන් තනි පුද්ගලයෙකුගේ ඉල්ලීමට අනුව මෙම රථ ගාල ඉවත් කිරීම යනු අපරාධකාරී වැඩක්. අපි මෙහි ජනතාව විසින් තෝරා පත්කරන ලද මන්ත්‍රීවරුන් සිටිනවා. සභාපතිවරියක්ද සිටිනවා. නගරයේ පිහිටි මාර්ග සියල්ල සභාව සතු වෙනවා. මෙසේ තිබියදී තනි පුද්ගලයෙකුගේ බලය පාවිච්චි කිරීම පිළිගන්න බැහැ. නල්ලතන්නියෙත් මෙවැනි සිදුවීමක් තමයි සිදු වුණේ. එකී පුද්ගලයාට අයත් සියළුම වාහන සභාවට අයත් වැන් රථ ගාලේ සවස 06.00 න් පසුව බලහත්කාරයෙන් ගාල් කරනු ලබනවා. පුද්ගලයෙක් එහි NO PARKING දැන්වීම් පුවරුවක් යොදා ඇති ස්ථානයක ඔහුගේ වාහන ටික ගාල් කරනවා. මේවා දැක දැක නොදැක්කා වගේ කටයුතු කිරීම කණගාටුදායක සිද්ධියක්. එනිසා ජනතාව වෙනුවෙන් ස්ථිර විසඳුමක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

එකී රථ ගාලට ඉදිරියෙන් ගරු මන්ත්‍රී දිසානායක මැතිතුමාගේ ප්‍රතිපාදන වලින් බස් නැවතුම්පොළක් ඉදිකර තිබුණා. පසුගිය කාලයේ අපගේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ලබා ගත් පසුව වුවද අඹගමුව ප්‍රාදේශීය සභාවේ රථ ගාල යන නාම පුවරුවක් එම ස්ථානයේ රදවා තිබුණා. මේ සම්බන්ධයෙන් ද සභාවේ සාකච්ඡා වුණා. මෙම රථ ගාල මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ලිපි ගොනුවල ඇතුලත් වෙනවා ද යන එක තමයි ප්‍රශ්නය. නඩුවක් පවරා තිබූ අවස්ථාවේ අධිකරණයේ දී මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ මතය වුයේ කුමක්ද?

ගරු සභාපති තුමියගේ අනුමැතියට යටත්ව ලේකම් තුමා විසින් ගරු මන්ත්‍රී කේ. සුරේෂ්කුමාර් මැතිතුමාගේ ප්‍රශ්නයට අදාළ තොරතුරු ඉදිරිපත් කරන ලදී.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

වංගුවක් සහිත ස්ථානයක වාහනයක් නවතා නොතිබිය යුතු යැයි පවසා ඇති බවට පොලීසිය විසින් කියනවා. වංගුවක් සහිත ස්ථානයක වාහන නොනවත්වා ඉතිරිව ඇති ස්ථානයක වාහනය නැවැත්විය හැකියි. එසේ නොමැති නම් වෙනත් පුද්ගලයෙකුට එම ස්ථානය අයත් වෙනවා. ගාල් කල හැකි වාහන පමණක් ගාල් කර වංගුවේ NO PARKING දැන්වීම් පුවරුව තැබිය යුතුයි. නල්ලතන්නිය වගේ නොමැතිව මෙම රථ ගාල මෙම රියදුරන් සඳහා ලබා දිය යුතුයි. මෙම සිද්ධිය සම්බන්ධයෙන් අපි කටයුතු නොකළේ නම් සභාවට අපහාස කරාවි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

ගරු මන්ත්‍රී තුමා පවසන පරිදි අපිත් පොලීසිය සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබුණා. ඒ අයත් පැවසුවේ වංගු සහිත ස්ථානවල වාහන නොනැවතිය යුතු බවටයි. නිශ්චිත වාහනවලට පමණක් එම ස්ථානය ලබා දී අනෙකුත් වාහන සඳහා වෙනත් ස්ථානයක් නිර්දේශ කිරීමට තීරණය කළා. වෙනත් වාහන නොනැවැත්විය යුතුයි නම් වෙළඳ සැල් හිමියන්ගේ වාහන ද ගාල් කරන්න බැහැ. පොලීසියේ වාහන කමිටුව සමග සම්බන්ධ වී අදාළ රථ ගාල් ලකුණු කිරීමට ද සූදානම් වෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති රථ ගාල් සංඛ්‍යාව කොපමණද, ඉන් කොපමණ රථ ගාල් සංඛ්‍යාවක් අපි ලියාපදිංචි කර තිබෙනවා ද? යන්න පළමුව සොයා බැලිය යුතුයි. මේවායින් කීයක් ගැසට් නිවේදනය කර තිබෙනවද? කියන එකත් බැලිය යුතුයි. වෑන් රථ ගාලට යාබදව පිහිටි මාර්ගය වසා ගෙන එහි සිටින පුද්ගලයෙක් වාහන අළුත්වැඩියා කිරීමේ කටයුතු වල නිරත වෙනවා. මාහට වෙන් කරන ලද ප්‍රතිපාදන යොදා ගනිමින් එහි ඇති මාර්ගයට වැට ඉදිකිරීම් කටයුතු සිදු කරන්න.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ගයේ, එහි වාහන ගාල් නොකළ යුතු බවට අධිකරණයෙන් නියෝග ලබා දී තිබෙනවා. එම ස්ථානයේ වාහන නවතා තැබිය යුතුයි, නැතිනම් වාහන නවතා නොතැබිය යුතුයි යන්න තීරණය කලයුත්තේ ප්‍රාදේශීය සභාවයි. එම රථ ගාල අපි මෙතෙක් ලියා පදිංචි කර නැහැ. මෙතෙක් රථ ගාල ගැසට් නොකිරීමත් අපගේ වරදක්.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

මෙම සිද්ධිය සම්බන්ධයෙන් ආරංචිය ලැබුණු මොහොතේම අපි ගොස් පොලීසිය සමග සාකච්ඡා කළා. ඔවුනුත් සභාවට පැමිණියේ ප්‍රශ්නයක් කියා ආවායින් පසුවයි. අප විසින් සිදු කළ යුතු දේ අපි සිදු කර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

වංගුවක් කියලා කියන එක ඇස්බැන්දුමක් පමණයි. දෙපැත්තෙන්ම මාරුවෙන් මාරුවට ගාල් කලා නම් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ නේද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

එම මාර්ගයේ දෙපැත්තේ ගාල් කරන්න බැහැ. එනිසා තමයි විකල්ප ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සොයාබලන්නේ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

තනි පුද්ගලයෙක් අධිකරණයේ නඩුවක් ගොනු කර ඔහුගේ පැත්තේ ඇති සාධාරණත්වය පැවසූ නිසා ඔහුගේ පැත්තට අධිකරණයේ තීන්දුව ලැබී තිබෙනවා. අපි ප්‍රාදේශීය සභාවක් වශයෙන් ජනතාව පැත්තට ඇති ගැටළු ඉදිරිපත් කර තිබුණා නම් අපටත් දිනා ගැනීමට අවස්ථාවක් තිබුණා. අපි එය සිදු කළේ නැහැ. එනිසා මෙම රියදුරන්ට අසාධාරණයක් නොවන පරිදි කටයුතු කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මේ කාරණාව සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ලබාගන්න.

**<u>ගරු මන්ත්‍රී එස්. ඒ. දිසානායක මැතිතුමා (ශ්‍රී.ල.පො.පෙ.)</u>**

රථගාල් සම්බන්ධව කතා කළහොත් මස්කෙළියේ ලියාපදිංචි රථගාල් 03 ක් තිබුණා. එනම්, තැපැල් කන්තෝරුව පාරේ තිබෙන වෑන් රථගාල, ලොරි රථගාල හා තිරුමහල් ඖෂධහල ඉදිරිපිට ඇති රථගාලයි. මෙතැනයි අවුරුදු 30 ක පමණ කාලයක සිට කුඩා ලොරි රථ නවත්වා තබාගෙන සිටියේ. මා සිතන්නේ පාර සංවර්ධනය කළායින් පසුවයි මෙම ගැටළුව බොහෝ දුරට ඇති වුණේ. කාණුව කැපුවායින් පසුව එම ස්ථානයේ ඉඩමේ බැම්ම පොඩ්ඩක් උස ගියා. ඒ සම්බන්ධයෙනුයි එහි කඩවල් ටික වැහෙනවා යනුවෙන් පැවසුවේ. අඟගමුව සභාව කාලයේ සිටම මෙම රථගාල මෙහි තිබුණා. නමුත් කිව යුතුයි, රථගාල් සම්බන්ධව සභාවෙන් ගත්තා ලද කිසිදු ක්‍රියා මාර්ගයක් නැහැ. මම අවුරු 20 ක් රියදුරෙකු ලෙස අංක 01 රථගාලෙහි සේවය කර

තිබෙනවා. අඩුම ගණනේ අවුරුදු 05 ක පමණවත් මෙහි මුදල් අයකර නැහැ. අපි මේ සභාව පිහිටුවා රථගාල් සම්බන්ධව කටයුතු කරන්න කිවුවත් අද වනතෙක් ඒ සම්බන්ධව කටයුතු කර නැහැ. එනිසයි මේ සියළු ප්‍රශ්න. වෑන්, ලොරි රථගාල් වල මස්කෙළියේ කිසිදු වාහනයක් ලියාපදිංචි කර නැහැ. සභාවට ආදායම් මාර්ගයක් ගෙන එන මාර්ගයක් වුණත් එයින් ආදායම අහිමි වී තිබෙනවා. තවත් කරුණක් පැවසිය යුතුයි ගරු සභාපතිතුමියනි, නල්ලතන්නියේ මෙම ගැටළුව නැවත ප්‍රකාශ කළා. වෑන් රථගාලෙහි ඉඩකඩ ප්‍රමාණවත් නොවන නිසා ගැසට් කර හෝ අපි තවත් රථගාලක් ලබාගත යුතු බව පැවසුවා. එය අවශ්‍ය වන විට පමණයි මෙම ප්‍රශ්නය මතු වන්නේ. පසුව මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු අප ළඟ නොමැති වි යනවා. එනිසා දිගින් දිගටම සභාවට ඇඟිල්ල දිගු කරනවාට වඩා සභාව මඟින් මේ සඳහා යම් ක්‍රියාමාර්ගයක් ලබාගත හොත් එය එතැනින් අවසන් වී යයි. අඹගමුවේ ලියාපදිංචි වූ වාහන වල පොත් ද අප සභාවේ ඇති ඒවාද පරීක්ෂා කර බලා කඩිනමින් මේ සඳහා විසඳුම් ලබා ගන්න. මන්ත්‍රීවරුන් පැවසු ආකාරයට අපි මෙතැනින් පිටව යද්දී අපිට අඩු ගානේ ඒ දේවත් කරන්න බැරි වුණා කියා චෝදනාවක් නොඑන්නට වගබලා ගත යුත්තේ අපිම බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන්න.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු මන්ත්‍රී දිසානායක මැතිතුමනි, දැන් එකී රථගාලේ රිසිට් කඩා තවමත් ලියාපදිංචි වී නැහැ. එදා සභාවට ගිය අවස්ථාවේ වෑන් රථ 10 කට රිසිට් කඩා ලියාපදිංචි කර ගොනු කර තිබුණා. මෙම කාරණාව වැරදියි කියා අපි කියන්නේ නැහැ. ගරු මන්ත්‍රීවරුන්ට මෙවැනි දේවල් දැනගන්න අවශ්‍යයි කියලයි මම කියන්නේ. අනෙක් අයත් මේ වගේ ලියාපදිංචි කළ යුතු බවටයි එදා අපි කිව්වේ. මෙවැනි දේවල් එළියට පේන්නේ නැහැ. මෙහිදී ගැටළු මතු වෙන්න හේතුවත් මෙවැනි දේවල් තමයි. හොඳ දේවල් වලට අපි හරස් වෙන්නේ නැහැ. එනිසා මෙවැනි හොඳ දේවල් කරන අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන්ද සම්බන්ධ කරගන්නා ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)</u>**

මෙම සභාව ආරම්භ කළ කාලයේ සිට මෙවැනි රථගාල් ප්‍රශ්න දිගටම පවතිනවා. මස්කෙළිය නගරයේ මම අවුරුදු විස්සකට වැඩි කාලයක් වාහන රියදුරෙක් වශයෙන් කටයුතු කර සිටිනවා. මෙම මස්කෙළිය නගරය සම්පූර්ණයෙන්ම අලංකරණය කර පිරිසිදුව තබාගැනීමට අවශ්‍ය කටයුතු අපගේ සභාව මගින් ක්‍රියාත්මක වෙනවා. අපට විරුද්ධව නඩු පවරමින්, අපට වරිපනම් ගෙවමින් එම ස්ථානයේ රැකියාවේ යෙදී සිටින රියදුරන් පහ කර එක්තරා තනි පුද්ගලයෙකුගේ උත්සහයකින් ඔහු ජයග්‍රහණය කර තිබෙනවා. මෙය ඉතාමත් වැරදි කාර්යයක්. එම ස්ථානයේ වංගුවක් තිබෙන නිසා වාහන වලට අපහසුතා තිබෙන බව පොලිසියෙන් පවසනවා. අවුරුදු තිහක් තිස්සේ එම වාහන රථගාල එකී ස්ථානයේම තිබෙනවා. එක්තරා තනි පුද්ගලයෙකු නිසා එම ස්ථානයේ රැකියා කරන අය ඉවත් කරන්න බැහැ. තවද වෑන් රථගාලට පිටුපසින් අඩි පාරක් සඳහා අපි සලකුණු කර තිබෙනවා. ඒ වගේම මෙම ස්ථානයේද එවැනි සලකුණු යෙදිය යුතුයි. ඒ සමගම වෙළඳසැල ඉදිරියේ පිහිටි අඩි පාරටද වැටක් ඉදි කළ යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

ගරු මන්ත්‍රීතුමනි, අඩි පාර සලකුණු කිරීමෙන් පසුව, එම හේතුවෙන් එම වෙළඳසැල් හිමියෝ සියළු දෙනා පැමිණ පැමිණිලිකර පොලිසියට ගොස් ප්‍රශ්නයක් මතුවුණේ. සමහරු තමන්ගේ කඩේට ඉදිරියෙන් NO PARKING BOARD එකක් තබා ගන්නවා. අපි ගිහින් එම බෝඩ් එක අයින් කරනවා. මේක තමයි දිගටම සිදු වෙන්නේ. වෙළඳසැල් වැසෙන බවට පැවසූ නිසා තමයි අපි එම වැඩසටහන ක්‍රියාත්මක කළේ. ඉන්පසුව එහි සිටින සියළුම රියදුරන් සභාවට පැමිණියා. ඒ අවස්ථාවේදී තමයි පළමුව ගෙවිය යුතු මුදල ගෙවන්න කියා මම පවසා සිටියේ.

**ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)**

මේ වගේම අනෙක් අයත් නඩු පැවරුවහොත් අපි මොනවද කරන්නේ? තනි පුද්ගලයෙකුට NO PARKING BOARD එකක් තබාගන්නවා. නල්ලතන්නියෙත් මෙවැනි ක්‍රියාවක් තමයි සිදු වුණේ.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

මේ කාරණාව පිළිබඳව අපි වෙනම සාකච්ඡා කරමු.

**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**

මේ සිද්ධිය සම්බන්ධව අපි දිගටම පැවසුවා. නමුත් මෙපමණ කාලයකට ගරු සභාපතිතුමියගේ බලය භාවිතා කරමින් සුදුසු කටයුතු කිසිවක් සිදු කළේ නැහැ.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

ගරු මන්ත්‍රීතුමනි, මම මොකක්ද කළේ නැහැ කියා ඔබතුමා කියා සිටින්නේ?

**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**

වෑන් රථ ගාල සම්බන්ධව මම සභාවේ කතා කළායින් පසුව තමයි එහි ලියාපදිංචිය ආරම්භ කළේ.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

සභාවට ගෙවිය යුතු අදාළ ගාස්තුව නොගෙවපු අයට අපි ලිපි කිහිපයක් නැවත යොමු කර තිබෙනවා. එම රථගාල් සභාපතිට අපි ලිපි යොමු කරනවා. අදාළ පුද්ගලයා මෙපමණ කාලයක් තිස්සේ සභාවට ගාස්තු ගෙවා නැති බවට ද, ඔවුන්ගේ ගාස්තු ගෙවන ලෙසටද පවසා අපි ලිපි යොමු කර තිබෙනවා. පසුව ඔවුන් සභාවට පැමිණ මෙපමණ මුදලක් තමන්ට ගෙවන්න බැරි බව පවසනවා. එසේ ඔබට ගෙවන්න බැරි නම් වාහන රථගාල ඉවත් කරන බවට ලිපි යොමු කිරීමට නියමිතයි. ඒක තමයි කරන්න පුළුවන්. අපි ජනතාව පැත්තත් බලන්න ඕනේ. එම අය එතනින් ඉවත් කළොත් මෙම ජනතා නියෝජිතයින් තමයි පැමිණ ඔවුන්ගේ පැත්තට කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**

අපි ඔවුන්ගේ පැත්තත් බලන්න ඕන. නමුත් මෙපමණ කාලයක් ප්‍රමාද කළ එක වැරදියි නේද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

ප්‍රමාද වීම වරදක් නොවේ. අවුරුද්දක් පාසා ලිපි 2 ක් හෝ 4 ක් යවනවා. ඒ සඳහා සාක්ෂි තිබෙනවා. දිගටම ගාස්තු නොගෙවා ඇති සියළු දෙනාගේ රථ ගාල් හිමිකම අහෝසි කරන්න කටයුතු කිරීමට මම සූදානම්. ඒ අවස්ථාවේදීත් ඔබ වැනි ගරු මන්ත්‍රීවරුන් තමයි ඒ අය වෙනුවෙන් කථා කරන්නේ.

**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**

ඒ අය ගෙවලා නැතිනම් එවැනි ක්‍රියාමාර්ගයන් ලබා ගන්න. තවද මෙම ලොරි රථ ගාලේ මෙය රැකියාවක් වශයෙන් ඉටුකරන අයව අධිකරණයෙන් ලැබුණු නියෝගය අනුව එකපාරට ඔවුන්ව ඉවත් කරන්න කියා පවසිය නොහැකි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

අධිකරණ නියෝගය සභාවට ලැබුණු විගස ඒ පිළිබඳව සාකච්ඡා කරමු.

## 04. මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා ඉදිරිපත් කිරීම.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මීළඟට මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා සභාවට ඉදිරිපත් කරමු.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
ගරු මන්ත්‍රී පී. රාජ්කුමාර් මැතිතුමා විසින් දීපාවලි උත්සවය නිමිත්තෙන් මස්කෙළිය පොදු ක්‍රීඩා පිටියේදී ලබාදුන් ටෙන්ඩර් පිළිබඳව අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
පළමු වතාවේ ටෙන්ඩර් කිරීමේදී බොහෝ වෙළඳ කුටි ලබා ගත්තේ නැහැ. නැවත වරක් ටෙන්ඩර් කළ ද වෙළෙඳ කුටි ලබා ගත්තේ නැහැ. ටෙන්ඩර් මඟින් ලබාදීමට නොහැකිවූ වෙළඳ කුටි මෙහි පැමිණ ඉල්ලා සිටින අයට ලබාදෙන බවට මුදල් කමිටුවේ දී තීරණයක් ලබාගෙන තිබුණා. තුන්වන වතාවට නැවතත් ටෙන්ඩර් කැඳවීමට කාල අවකාශය තිබුණේ නැහැ.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
ගරු මන්ත්‍රී කේ. රාජ්කුමාර් මැතිතුමා විසින් 2023 වර්ෂයට අදාල ගව මස් කඩේ ටෙන්ඩර් පිළිබඳව අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු මන්ත්‍රී කේ.යෝගේන්ද්‍රන් මැතිතුමා (එ.ජා.නි.පෙ)**
මුදල් කමිටුව සඳහා නව සාමාජිකයින් පත්කර ගැනීම පිළිබඳ වූ කරුණු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
ගරු මන්ත්‍රී එස්. සුරේෂ් කුමාර් මැතිතුමා විසින් දීපාවලි උත්සවය නිමිත්තෙන් මස්කෙළිය පොදු ක්‍රීඩාපිටියේ දී ලබා දෙන ලද ටෙන්ඩර් පිළිබඳව සහ මුදල් කමිටු සාමාජිකත්වය පිළිබඳව ද අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
සභාවක් වශයෙන් සියළුම දෙනා සහයෝගයෙන් කටයුතු කළ යුතුයි. මට ඉන්න බැහැ, මට ඉන්න බැහැ කියා පවසනවනම් එතකොට කවුද මේ කමිටුවේ සාමාජිකත්වය දරන්නේ?

**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**
ගරු මන්ත්‍රී එස්. සුබ්‍රමනියම් මැතිතුමා විසින් දීපාවලි උත්සවය නිමිත්තෙන් මස්කෙළිය පොදු ක්‍රීඩාපිටියේ දී ලබා දෙන ලද ටෙන්ඩර් පිළිබඳව අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
ගරු මන්ත්‍රී පී. රාජ්කුමාර් මැතිතුමා විසින් මස්කෙළිය පොදු ක්‍රීඩා පිටියේ ලියා පදිංචිය පිළිබඳව අදහස් ඉදිරිපත් කරන ලදී.

**ගරු මන්ත්‍රී පී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)**
මුදල් කමිටු වාර්තාව නිවැරදි බවට මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පී.ආනන්ද්රාජ් මැතිතුමා (ලං.ක.කො)**
එම යෝජනාව මම ස්ථිර කරමි.

## 2022.11.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව නිර්දේශයෙන් පසු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

**කාරණා අංක 01**
ඔක්තෝම්බර් මස ආදායම් හා වියදම් තනි තනියෙන් පැහැදිලිව මුදල් කමිටුවට ඉදිරිපත් කරන කළ අතර ඔක්තෝම්බර් මස ආදායම් හා වියදම් වාර්තාව නිවැරදි බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් පිළි ගන්නා ලදි.

**කාරණා අංක 02**
පාසල් ළමුන් සඳහා ආයුර්වේද බෙහෙත් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම සම්බන්ධයෙන්, මුදල් කමිටුවේදී කරුණු සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 02**
ඉහත දක්වන ලද වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 03**
ශ්‍රී පාද වන්දනා සමය පවතින කාලය තුල පරිසර ආරක්ෂණය සම්බන්ධව එහි සිටින වෙළඳ මහතුන් දැනුවත් කිරීම සම්බන්ධව කරුණු සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 03**
ශ්‍රී පාද වන්දනා සමය ආරම්භවීමට පෙර පරිසර ආරක්ෂණය සම්බන්ධව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 04**
ශ්‍රී පාද වන්දනා සමයේදී කම්කරුවන් සඳහා ජැකට් එකක් ලබාදීම සම්බන්ධව පරිසර නිලධාරිතුමිය විසින් ලබා දුන් ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 04**
එම ජැකට් එක ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 05**
මස්කෙළිය නගරයේ ප්‍රධාන මාර්ග අබලන් වී ඇති බැවින් එම මාර්ග පිළිසකර කිරීමට එක් එක් වීදි සඳහා වෙන් වෙන් වශයෙන් සකස් කරන ලද ඇස්තමේන්තු මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

| Road | Amount |
|---|---|
| Maskeliya 9th Street | 113,243.33 |
| Maskeliya Water Board Road | 137,182.14 |
| Maskeliya Bus Stand Road | 82,497.02 |
| Maskeliya sri Sanmuganadhar kovil Road | 1,161,567.60 |
| Maskeliya 2nd Street | 215,974.66 |
| Maskeliya 7th Street | 161,979.64 |
| Maskeliya 4th Street | 259,827.28 |

**තීරණ අංක 05**
සභාවේ මුදල් තත්වය අනුව මෙම මස මාර්ග දෙකක්ද අනෙක් මාසවල එක් මසකට එක් මාර්ගය බැගින්ද පිළිසකර කිරීම සඳහා මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 06**
RD – 1231 ට්‍රැක්ටර් රථය අළුත් වැඩියා කිරීම සම්බන්ධයෙන් වූ ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 06**
තාක්ෂණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එම රථය අළුත් වැඩියා කිරීම සඳහා මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 07**
ජී.ඩබ්.ජී.වයි.එම්. සම්පත් නමැති පුද්ගලයා විසින් ටෙන්ඩර් මඟින් ලබා ගත් තාවකාලික කඩ කාමර වලින් ඔහුට සිදුවූ අලාභය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 07**
ඉහත කරුණ සම්බන්ධයෙන් විමර්ෂණ නිලධාරීතුමා මඟින් සහකාර කොමසාරිස්තුමාගේ නිර්දේශය ලබා ගැනීම සඳහා ලිපියක් යොමු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 08**
2023 වර්ෂයේ මස්කෙළිය ප්‍රාදේශීය සභාවෙන් ගවමස් කඩය, එළු මස් කඩය, මාළු කඩ අංක 01, 02, 03, මස්කෙළියග - සාමිමලේ වැසිකිළි පද්ධතිය, නල්ලතන්නිය පොදුරථ ගාල හා වැසිකිළි පද්ධතිය, මකර තොරණ පොදු වැසිකිළි පද්ධතිය, ගඟුලතැන්න පොදු වැසිකිළි පද්ධතිය, මුල්ගම හන්දිය තාවකාලික කඩ කාමරය, පුවත්පත්වල පල කිරීම පිළිබඳව මුදල් කමිටුවේදී සාකච්ඡා කළ අතර ඒ සමඟම මලන්ලෝ හා වොන්රෝ යන ආයතන මඟින් ශ්‍රී පාද වන්දනාව සඳහා පැමිණෙන බැතිමතුන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ ලිපි මුදල් කමිටුවට ඉදිරිපත් කළ අතර එහිදී පෙර වර්ෂ වල මකර තොරණ හා ගඟුලතැන්න වැසිකිළි පද්ධති ලබා ගන්නා ලද මලෙන්ලෝ ආයතනය සම්බන්ධයෙන් චෝදනා ගරු මන්ත්‍රීවරුන් විසින්  සඳහන් කරන ලද අතර එහිදී මෙම වැසිකිළි පද්ධතිය නොමිලේ ලබාදෙන බවට පැවසුවද එහි මුදල් අයකරන බවට ඔවුන් හට පැමිණිලි ලැබී ඇති බවටද සඳහන් කරන ලදී.

එමෙන්ම පෙර වර්ෂවල මෙම වැසිකිළි පද්ධති ටෙන්ඩර් මඟින් ලබාගත් පුද්ගලයින් විසින් එම වැසිකිළි පද්ධති විවෘත ටෙන්ඩර් මඟින් ලබාදෙන ලෙස ඉල්ලීමක් සභාව වෙත ඉදිරිපත් කර තිබුණි.

එම සියළු කරුණු සලකා බලා තරඟකාරී ටෙන්ඩර් කිරීමක් මඟින් සභාවට උපරිම ආදායමක් ලබාගත හැකි බැවින් නල්ලතන්නිය හි සභාව සතු සියළුම වැසිකිළි පද්ධති හා අනෙකුත් සභාව සඳහා ඇති සියළුම දේපල විවෘත ටෙන්ඩර් මඟින් ලබාදීම සම්බන්ධයෙන් මුදල් කමිටුවේදී කරුණු සාකච්ඡා කරන ලදී. එහිදී 2023 වර්ෂයේ මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ ගවමස් කඩය, එළු මස් කඩය, මාළු කඩ අංක 01, 02, 03, මස්කෙළිය - සාමිමලේ වැසිකිළි පද්ධතිය, නල්ලතන්නිය පොදුරථ ගාල හා වැසිකිළි පද්ධතිය, මකර තොරණ පොදු වැසිකිළි පද්ධතිය, ගඟුලතැන්න පොදු වැසිකිළි පද්ධතිය, මුල්ගම හන්දිය තාවකාලික කඩ කාමරය විවෘත ටෙන්ඩර් මඟින් ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී.

**තීරණ අංක 08**
2023 වර්ෂයේ මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ ගවමස් කඩය, එළු මස් කඩය, මාළු කඩ අංක 01, 02, 03, මස්කෙළිය - සාමිමලේ වැසිකිළි පද්ධතිය, නල්ලතන්නිය පොදුරථ ගාල හා වැසිකිළි පද්ධතිය, මකර තොරණ පොදු වැසිකිළි පද්ධතිය, ගඟුලතැන්න පොදු වැසිකිළි පද්ධතිය, මුල්ගම හන්දිය තාවකාලික කඩ කාමරය විවෘත ටෙන්ඩර් මඟින් ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 09**
ශ්‍රී පාද වන්දනා සමයේ වනජීවී බල ප්‍රදේශය තුල සෞඛ්‍ය කම්කරුවන් සඳහා මාසික වැටුප් ගෙවීම සම්බන්ධයෙන් මුදල් කමිටුවේදී කරුණු සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 09**
ඉහත කරුණ සම්බන්ධයෙන් වනජීවී දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 10**
නල්ලත්නිය රථ වාහන නැවතුම් පොල සඳහා මෝටරයක් ලබා ගැනීම සම්බන්ධව මුදල් කමිටුවේදී කරුණු සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 10**
එම මෝටරය ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 11**
මස්කෙළිය එළුමස් කඩය සඳහා විදුලිය ලබා ගැනීම පිළිබඳව කරුණු ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 11**
මස්කෙළිය එළුමස් කඩය සඳහා විදුලිය ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 12**
ශ්‍රී පාද වන්දනා සමයේ පිරිසිදු කිරීම් කටයුතු සඳහා අවශ්‍ය සෞඛ්‍ය භාණ්ඩ අප විසින් ලබාගත යුතු බැවින් ඒ සඳහා ලබා ගන්නා ලද මිල ගණන් මුදල් කමිටුවේදී විවෘත කරන ලදී.

**තීරණ අංක 12**
ලැබීතිබූ මිළ ගණන් අතරින් උසස් තත්වයේ උපකරණ හා ද්‍රව්‍ය වෙනුවෙන් අවම මිළ ගණන් ඉදිරිපත් කළ ආයතන වලින් මිළදී ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 13**
කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය Service කිරීම සඳහා JOHN KEELS OFFICE AUTOMATION (PVT)LTD ආයතනයෙන් එවන ලද ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| TOSHIBA DIGITAL COPIER , DP2007T | 16,596.01 |
| TOSHIBA PHOTOCOPY MA , DP2809A | 19,943.00 |

**තීරණ අංක 13**
එම යන්ත්‍රය Service කිරීම සඳහා මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 14**
සතිපොල ආරම්භ කිරීම පිළිබඳව මුදල් කමිටුවේදී සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 14**
අදාල ප්‍රදේශයකින් කාබනික පොහොර පමණක් භාවිතා කර එළවළු වගා කරන පුද්ගලයින් තෝරා කෘෂිකර්ම නිලධාරීතුමාගේ නිර්දේශය ලබාගෙන ඒ අයට සති පොලක් පැවැත්වීම සඳහා ඉඩ සලසා දීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 15**
මස්කෙළිය පොදු වැසිකිළිය අළුත්වැඩියා කිරීම සඳහා අදාල ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 15**
එම වැසිකිළිය අළුත්වැඩියා කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී.මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)**
මුදල් කමිටුව සඳහා නව සාමාජිකයින් පත්කර ගැනීම සම්බන්ධව ගරු උප සභාපති තුමා විසින් යෝජනා ඉදිරිපත් කරන ලදී.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය පිළිබඳ ව ගරු මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 16**
ගරු උප සභාපති පි. පී. ප්‍රදීබන් මැතිතුමා, ගරු මන්ත්‍රී කේ රාජ්කුමාර් මැතිතුමා, ගරු මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා යන මන්ත්‍රීවරුන් මුදල් කමිටු සාමාජිකත්වය සඳහා පත්කරගැනීමට සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

## 05. 2023 වර්ෂය සඳහා වූ යෝජිත අයවැය වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පූජාභූමියක් වන ශ්‍රීපාද අඩවියේ පිහිටි මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය භාර ගැනීමෙන් පසු ;පස්වන වරට ඉදිරි වසර තුල ක්‍රියාත්මක කිරීමට හදුනාගත් ව්‍යාපෘති සඳහා දැරීමට සිදුවන වැය බරත්, එකී වැය බර පියවා ගැනීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සකසා ගන්නා

ආකාරය ඇතුලත් කර මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ ගරු සභාව විසින් සම්මත කර ගත් 2023 වර්ෂය සදහා වන වාර්ෂික අයවැය ලේඛනය සකස් කර ඇත. මෙම අයවැය වාර්තාවේ සදහන් pකරුණු මෙම වර්ෂයේදී නිසි මග පෙන්වීම හා වගකීමෙන් යුතුව ඉදිරි අනාගතය උදෙසා ක්‍රියාත්මක කිරීමට අදහස් කරමි.

ග්‍රාම නිලධාරී කොටඨාශ 11 කින් හා වර්ග කි.මී. 155 කින් යුක්තව මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය සැදුම්ලත් වන අතර වතුකර ජනතාවගේ හා ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය වන්නේ ප්‍රදේශයේ ආර්ථිකයෙන් 60%ක් උපයන තේ කර්මාන්තයයි. එමෙන්ම මෙම ප්‍රදේශයේ සෞඛ්‍ය, ආගමික හා සංස්කෘතික මෙන්ම පානීය ජල වැනි කටයුතු පසුගිය කාලයට වඩා සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි වීම පිලිබඳව මා ඉතා සතුටට පත් වෙමි. මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ භෞතික හා ආර්ථික තත්වය සංවර්ධනය කිරීමටත් ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීමටත් අවශ්‍ය ප්‍රතිපාදන 2023 අයවැයේදී වෙන්කර ඇති බව සතුටින් දන්වා සිටිමි.

ශ්‍රී ලංකා පළාත් පාලන සංසදය හා කැනේඩියානු ආධාර යටතේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන යටතේ කාන්තා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය මඟින් 2023 වර්ෂයේ අයවැය සැකසීම සඳහා රාජ්‍ය සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, සමිති මඟින් හා සෘජුව මහජන අදහස් ලබා ගැනීමට අවස්ථාව සැලසීම හා transeparency International Sri Lanka ආයතනය මඟින් ඊට ලබා දුන් මඟපෙන්වීම සමබන්ධයෙන් මා විශේෂයෙන් ස්තූතිවන්ත වෙමි.

මස්කෙළිය ප්‍රාදේශීය සභාව මඟින් 2022 වර්ෂයේදී පහත පරිදි විශාල සංවර්ධන වැඩසටහන් ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුණු බව සතුටින් ප්‍රකාශ කරමි. ඒ අතුරින් විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් වතු ආශ්‍රිතව ක්‍රියාත්මක කර ඇත.

1. ගරු මන්ත්‍රීවරුන් සදහා වතු ප්‍රදේශවල සංවර්ධන කටයුතු සිදු කිරීමට රු.100,000.00 බැඟින් ප්‍රතිපාදන වෙන් කිරීම.
2. ආපදා ත්තවයන් සදහා මුහුණ දුන් පිරිසට සහන සැලසීම.
3. පුස්තකාලය සදහා නව උපකරණ, පොත් ලබා ගැනීම, නැණසල ඉගෙනුම් මධ්‍යස්ථානය ආරම්භ කිරීම හා තාක්ෂණික පහසුකම් වැඩිදියුණු කිරීම
4. මස්කෙලිය නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම හා සභා අරමුදලින් රු.100,000.00ක ඖෂධ ලබා දීම.
5. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය හා කැනේඩියානු පළාත් පාලන ආයතනයන්ගේ සංසදය ඒකාබද්ධව කැනේඩියානු ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත සය අවුරුදු ව්‍යාපෘතියේ ගිවිසුම අත්සන් කිරීම.
6. කොට්ඨාශ මට්ටමින් ඩෙංගු මර්ධන වැඩසටහන් හා ශ්‍රමදාන ක්‍රියාත්මක කිරීම.
7. වැසිකිළි අළුත්වැඩියා කිරීම.
8. කාණු පද්ධති අළුත්වැඩියා කිරීම.
9. ගම සමඟ පිළිසඳරක් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
10. මාර්ග අළුත්වැඩියා කිරීම හා කොන්ක්‍රීට් කිරීම.
11. ගර්භනී මව්වරුන්ට උපකරණ ලබා දීම
12. ස්වයං රැකියා සඳහා අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම (සබන්, අත්සෝදන දියර හා ඉටිපන්දම්)
13. ගෙවතු වගා සඳහා අවශ්‍ය පැළ වර්ග හා බීජ ලබා දීම
14. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

රටතුල උද්ගතව පවතින ආර්ථික අර්බුධය හමුවේ අඩු ආදායම්ලාභී සභාවක් වශයෙන් මස්කෙලිය ප්‍රාදේශීය සභාවේ කටයුතු සාර්ථකව සිදු කර ගෙන යාමේදී නොමදව සහය දුන් ජනාධිපතිතුමන්, අගමැතිතුමන්, නුවරඑළිය දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ලංකා කම්කරු කොංග්‍රසයේ ප්‍රධාන ලේකම් ජීවන් තොණ්ඩමන් මැතිතුමා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ලංකා කම්කරු කොංග්‍රසයේ සභාපති රාමේෂ්වරන් මැතිතුමා, ලංකා කම්කරු කොංග්‍රසයේ සභාපති සෙන්දිල් තොණ්ඩමන් මැතිතුමා, ගරු මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා වෙත හෘදයාංගම ස්තූතිය පුද කර සිටිමි

මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යංශයේ ලේකම්තුමා, මධ්‍යම පලාත් පළාත් පාලන කොමසාරිස්තුමා, නුවරඑළිය දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා ඇතුළු දෙපාර්තමේන්තු නිලධාරීන්ට හා නුවරඑළිය විගණකාධිකාරීතුමා ඇතුළු ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්ගේ මඟ පෙන්වීම හා සහයෝගය ලබාදීම පිළිබඳව මාගේ ගෞරවනීය ස්තූතිය පල කර සිටිමි.

ප්‍රාදේශීය සභාවේ කාර්යාල කටයුතු හා අනෙකුත් කටයුතු ක්‍රමවත්ව ඉදිරියට ගෙන යාමට සහයෝගය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරුන් හා ලේකම්තුමා, ප්‍රධාන කළමනාකරණ සහකාර ඇතුළු කාර්යාලයේ සියළුම නිලධාරීන්ට හා සේවකයින්ට හෘදයාංගම ස්තූතිය පුද කර සිටිමි.

උදාවන 2023 වර්ෂයේ මස්කෙළිය ප්‍රාදේශීය සභා ඉතිහාසය පෙර නොවූ ආකාරයෙන් වැදගත් යහපත් සේවාවක් මහජනතාවට ලබා දීමටත් විශේෂයෙන් වතුකරයේ ජනතාව වෙනුවෙන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, කාන්තාවන් සඳහා විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් හා සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, පිළිකා රෝගයෙන් පෙළෙන අයට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් අපේක්ෂා කරමි. එම කාර්යභාරය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සදහා පෙර සදහන් සියළු පාර්ශවයන්ගේ සහයෝගය හා මඟ පෙන්වීම අපේක්ෂා කරමි.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

මෙම සභාව ආරම්භ කර පස්වන අයවැය වාර්තාව ඉදිරිපත් කර ඇති අවස්ථාවේදී මා හට අදහස් දැක්වීමට අවස්ථාවක් ලැබීම සම්බන්ධයෙන් සතුටු වෙමි. මෙම අවස්ථාවේදී මාව මෙම සභාවට තෝරා පත්කරන ලද ඡන්ද දායකයින් වෙත ද මාගේ ස්තූතිය පුද කරන අතර තවද අපව තෝරා පත් කර ගනිමින් මැතිවරණයකට යොමුකළ පක්ෂයේ සභාපතිවරුන් සහ පක්ෂයේ සාමාජිකයින් සියළු දෙනාටම ද ස්තූතිය පුද කරමින් මෙම අයවැය වාර්තාව පිළිබඳව අදහස් දැක්වීමට සූදානම් වෙමි. අපගේ ප්‍රාදේශීය සභාව ඇත්තවශයෙන්ම විශාල ආදායමක් නොමැති සභාවක් වුවද, ගැටළුකාරී තත්වයන් මත වුවද මෙම සභාව ඉතාමත් විධිමත් ලෙස පවත්වාගෙන යන බවට ප්‍රකාශ කරමින්, අංක 1987 /15 දරණ ප්‍රාදේශීය සභා ආඥාපනතෙ 33 වන වගන්තිය සංශෝධනය කළ ද එය සම්පූර්ණ වී නැහැ. එය සම්පූර්ණ වී තිබුණා නම් අපට ඡන්දය ලබා දුන් ජනතාවට විශාල වැඩ කොටසක් ඉටු කරන්න තිබුණා. මේ සඳහා මම සභාවට දොස් පවරන්නේ නැහැ. නීතියේ දක්නට ඇති ගැටළුකාරී තත්වයන් නිසා ජනතාවට සේවය කිරීමට බාධාවන් ඇති වූ බව මම සඳහන් කිරීමට කැමැත්තෙමි. තවද ම ප්‍රදේශයේ පිහිටි පෙර පාසල් සියල්ල සංවර්ධනය කර ප්‍රාදේශිය සභාව යටතට පත් කිරීමට අපි යෝජනා කළා. නමුත් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවුයේ නැහැ. තවද සියළුම වතුවල පුස්තකාල ආරම්භ කිරීමට සූදානම් වුවත් එයද ඉටු කිරීමට නොහැකි වුණා. තවද සියළුම වතු ප්‍රදේශවල ආයුර්වේද රෝහල් සේවාව

දියත් කළ යුතු බවට හෝ ජංගම ආයුර්වේද සේවාව ලබාදිය යුතු බවට මා සඳහන් කර තිබුණා. එය ද ක්‍රියාත්මක වුණේ නැහැ.

එමෙන්ම සභාව විසින් ඉටුකළ යහපත් දේවල් පිළිබඳව ද අපිට අමතක කරන්න බැහැ. තවද අඩු ප්‍රතිපාදන ලබා ගනිමින් අනෙකුත් සභාවලට වඩා වැඩි වශයෙන් වැඩසටහන් ඉටුකර තිබෙනවා. ඒ අනුව ගරු සභාපතිතුමියට සහ සභාවේ සියළු දෙනාට ස්තූතිවන්ත වෙමි. තවද අපි අඩු වශයෙන් ප්‍රතිපාදන ලබාගෙන එම ප්‍රතිපාදන මගින් ජනතාවට කුඩා පරිමාණයේ මාර්ග ඉදිකර දුන්නා. සභාව සමඟ සම්බන්ධ වෙමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළා. එමෙන්ම මුදල් නැතිව ඉටු කළ හැකි විවිධ වැඩසටහන් අපි ක්‍රියාත්මක කළා. කොවිඩ් වසංගත අවස්ථාවේදී විෂබීජ හරණය වැනි වැඩසටහන්වලදී අපි සියළුම දෙනා ක්ෂේත්‍රයේ සිට ක්‍රියාත්මක වීම අමතක කරන්න බැහැ. ඒ වගේම පසුගිය අයවැය යෝජනාවේදී ස්වයං රැකියාව පිළිබඳව සඳහන් වී තිබුණා. එය මෙම අවුරුද්ද තුලදී ක්‍රියාත්මක කිරීම ප්‍රශංසා කළ යුතු දෙයක්. 2022 වර්ෂය ආරම්භයේ දී රජය විසින් සියළුම මන්ත්‍රීවරුන් සඳහා රුපියල් ලක්ෂ හතළිහක ප්‍රතිපාදනයක් ලබාදී ව්‍යාපෘති ආරම්භ කර තිබුණා. රටේ උද්ගතවූ අසාමාන්‍ය තත්වය නිසා එම ව්‍යාපෘති ඉදිරියටත් ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඉටු කළ හැකි වැඩසටහන් ඉටුකළා. මේ සඳහා රජයටත්, සභාවේ සභාපති තුමියටත්, ලේකම්තුමාටත්, කාර්මික නිලධාරීන්ටත් ස්තුතිය පුද කරමින්, මෙම අවුරුද්දේ අයවැය වාර්තාව සියළු දෙනාගේම යෝජනා ඇතුළත්ව ඇති බවට පිළිගත යුතු වෙනවා. ඒ වගේම එක් එක් ආයතන මගින් මේ සඳහා පුහුණුව ලබාදී තිබෙනවා. වැඩමුළු පවත්වා තිබෙනවා. තවද සභාව මඟින් ලබා ගන්නා තීරණ වහාම ක්‍රියාත්මක කළේ නම් තවදුරටත් සාර්ථක වන බවට ප්‍රකාශ කර සිටිමි.

**<u>ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)</u>**

ගරු සභාපතිතුමා විසින් 2023 වර්ෂය සඳහා වූ අයවැය වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබෙනවා. අනෙකුත් සභා සමග සංසන්දනය කිරීමේ දී අපේ සභාව වැඩි වශයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ආනන්දන් මැතිතුමා ද ප්‍රකාශ කර සිටියා. තවද අවුරුදු දෙකහමාරක් පුරාවට රටේ පැවති අසාමාන්‍ය තත්වය නිසා කොටස් වශයෙන් රට වසා තැබීමට සිදු වුණා. එම අවස්ථාවේදී වුවද මස්කෙළිය ප්‍රාදේශීය සභාව ඉතාමත් සාර්ථක ලෙස ක්‍රියාත්මක වී තිබුණා. මන්ත්‍රීවරුන් සඳහා වෙන්කල ප්‍රතිපාදන මගින් ඉටුකළ ව්‍යාපෘතීන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මගින් වෙන්කල ප්‍රතිපාදන හරහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ඉතාමත් සාර්ථක ලෙස ඉටු වී තිබුණා. අපට ඉතා හොඳ සභාපතිතුමියක් සහ ලේකම්වරයෙක් ලැබී තිබෙනවා. තවද සභාව ඉතාමත් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා හොඳ ගරු මන්ත්‍රීවරුන් ද ලැබී තිබෙනවා. සමහර කරුණු සම්බන්ධයෙන් වාද විවාද ඇතිවුවද හොඳ ව්‍යාපෘති සඳහා එම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා දීමට කිසිදිනක පසුබට වූයේ නැහැ. මේ නිසා තමයි ලංකාව පුරාවටම කතාවෙන කාන්තා සභාපතිවරුන් අතරට අපේ සභාපතිතුමියත් ඇතුළත් වී සිටින්නේ. අපි සියලුම දෙනා කිසිම භේදයකින් තොරව සහයෝගයෙන් කටයුතු කළ බව දක්නට ලැබෙනවා. මෙම අයවැයට මාගේ සහයෝගය පලකරන අතර මෙහි සිටින අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් ද මේ සඳහා පූර්ණ සහයෝගය ලබාදෙමින් මස්කෙළිය ප්‍රාදේශීය සභාවට පක්ෂව කටයුතු කළ යුතු බවට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

මෙම සභාවට මා සුදුසු අයෙක් බවටත්, මරේ 320 H ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශය ජනතාවගේ නියෝජිතයා වශයෙන් තෝරා ගැනීමට සුදුස්සා බවටත් මාගේ නම යෝජනා කිරීමට පිටුපසින් ඔබ සිටිය යුතු බවටත් ඉල්ලා සිටි අපගෙන් වෙන් වූ අභාවප්‍රාප්ත නායක ගරු

ආරුමුගන් තොන්ඩමන් මැතිතුමාටත් දැනට එම ධුරය හොබවන සභාපති සෙන්දිල් තොණ්ඩමන් මැතිතුමාටත් ප්‍රධාන ලේකම් ජීවන් තොන්ඩමන් මැතිතුමාට ගරු සභාපතිතුමියටත් ගරු රාමේෂ්වරන් මැතිතුමා ඇතුළු සියළුම දෙනාටත් ස්තුතිය පුදකරමි. මා මෙහි තෝරා පත්කර එවා තිබෙන්නේ ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමටයි. ඒ අනුව සභාවට ඉදිරිපත් කළ යෝජනාවට අනුව සභාවේ මූල්‍ය තත්වයේ ගැටළු තිබුණත් ප්‍රතිපාදන පමණක් ප්‍රයෝජනයට නොගෙන වෙනත් මාර්ග ඔස්සේද සභාව මගින් සේවාවන් දියත් කළා. මෙහිදී ඍජු කරුණු සමහරක් ද වක්‍ර කරුණු සමහර ද දක්නට තිබෙනවා. අභාවප්‍රාප්ත අමාත්‍ය තොන්ඩමන් මැතිතුමා විසින් වෙන්කල ප්‍රතිපාදන මගින් ද හිටපු අමාත්‍ය ජීවන් තොන්ඩමන් මැතිතුමාගේ ප්‍රතිපාදන මගින් ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රාමේෂ්වරන් මැතිතුමා විසින් වෙන්කල ප්‍රතිපාදන මගින් ද මරේ කොට්ඨාශයේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළා. එපමණක් නොවේ, 2022 අයවැය වාර්තාවේ වෙන්කල ප්‍රතිපාදන ද ලබාදී තිබුණේ නම් තවත් සාර්ථක කරගන්න ඉඩ තිබුණා. ඒ සඳහා අවශ්‍ය කටයුතු ද ගරු සභාපතිතුමිය විසින් සිදු කරන්නේ නම් තවත් පහසු වේවි. තවද සභාවේ ගරු මන්ත්‍රීවරුන් ඇමතීම සඳහා stand mic එකක් අවශ්‍ය බවට සභාව ආරම්භ කළ කාලයේ සිට අපි ඉල්ලා සිටියා. එයද ලබාගැනීමට නොහැකි වුණා. එයද අඩුපාඩුවක්ව පවතිනවා. ගරු මන්ත්‍රී වරුන් සඳහා ලබාදිය යුතු හැඳුනුම්පතද මෙතෙක් ලබා දී නැහැ. මීළඟට කුඩා නගර සියල්ල ප්‍රධාන නගර වශයෙන් ප්‍රකාශ කර ඒ සඳහා වූ අතුරු ව්‍යවස්ථාවද ස්ථාපිත කරන ලෙසට මම ගරු සභාපති තුමියගෙන් ඉල්ලා සිටිනවා. නල්ලතන්නිය සහ ලකම් වැනි නගරද ඇතුළත් කරන්නේ නම් සුදුසු වේවි. වෙනත් අයවැය වාර්තාවවලට වඩා මෙම අයවැය වාර්තාවට ජනතාවගේ අදහස් ද, සමාජ සංවිධාන වල අදහස් ද ලබා ගනිමින් වෙනත් ආකාරයකින් සකස් කර තිබෙනවා. තවද විවිධ ආයතන මගින් මන්ත්‍රීවරුන්ට සහ නිළධාරීන් වෙත ලබා දෙන ලද පුහුණුවට අනුව මෙම අයවැය සකස් කර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මෙම ගරු සභාව වෙත මාව යොමු කිරීම වෙනුවෙන් දෙමළ ප්‍රගතිශීලී සන්ධානයේ නායක අපගේ සභාපති දිගම්බරම් මැතිතුමාට ද මාහට මෙම අවස්ථාව ලබාදුන් අංක 320 N බ්‍රවුන්ලෝ වසමේ ජනතාවටද මාගේ විශේෂ ස්තුතිය පුද කරමි. මෙම අයවැය ඉතාමත් ක්‍රමවත්ව සකස් කර තිබෙනවා. නව විෂයන් ඇතුළත් කර මෙම අයවැය සකස් කර තිබුණත්, මෙම සභාව අවුරුදු හතරක් තිස්සේ සාර්ථක සේවාවක් ලබාදී තිබුණත්, 1987 අංක 15 හි 33 වන වගන්තිය සංශෝධනය යටතේ වතු ප්‍රදේශ වලට සභාව මගින් වැඩසටහන් දියත් කිරීමට යෝජනා සඳහන් වුවත්, පසුගිය කාලවකවානුවේ වතුකරය සඳහා අපි වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවාද යන්න සොයා බැලූ කළ, ගරු සභාපතිතුමියගේ කතාවෙන් රුපියල් ලක්ෂයක් ප්‍රතිපාදන වෙන්කර තිබෙනවා. තවමත් මෙම රුපියල් ලක්ෂය ලබාදී නැහැ. එසේ තිබියදී වුවද ආපදා අවස්ථා වලදී බොහෝ ස්ථාන සඳහා අපි උදව් කිරීමට ඉදිරිපත් වුණා. නමුත් ඉන් කීදෙනෙක් ප්‍රතිලාභ ලබා ගත්තද? ඩෙංගු මර්දනය සඳහා අපි වතු කීයකට වැඩ කර තිබෙනවද? එයත් ඉතාමත් අඩුයි. වැසිකිලි පද්ධති අළුත්වැඩියා කිරීම කානු පද්ධති අළුත්වැඩියා කිරීම වැනි වැඩසටහන් නගර වලට පමණක් සීමා කර තිබෙනවා මිසක් වතුකරයට ක්‍රියාත්මක වුණේ නැහැ. ප්‍රාදේශිය සභා ප්‍රතිපාදන යටතේ කිසිම මාර්ගයක් අළුත්වැඩියා කළේ නැහැ. වතුකරය සඳහා වැඩසටහන් දියත් කිරීමට ප්‍රතිපාදන වෙන් කිරීමේ මූල්‍ය අඩුපාඩු තිබුණද ප්‍රතිපාදන නොමැතිව ඉටු කළ හැකි වැඩසටහන් පිළිබඳව අපි පවසා තිබුණා. තීරණ වැඩිමනක් අපි ලිපි මඟින් පමණක් ඉටුකර තිබෙනවා. මූල්‍ය තත්වය ප්‍රමාණවත් නොවීම මෙයට හේතුවක් වෙනවා. මම සභාපතිතුමියට දොස් පවරන්නේ නැහැ. රටේ පවතින ආර්ථික ප්‍රශ්නයත් මෙයට හේතුවක් වෙනවා. මම මේ අයවැයට විරුද්ධ කතා කරනවා මිස සභාපතිතුමියට විරුද්ධව හෝ ලේකම්තුමාට විරුද්ධව කතා කරන්නේ නැහැ. කෙදිනක හෝ වතුකරය සඳහා ව්‍යාපෘති සම්පූර්ණයෙන් ඉටුකිරීමට හැකි වෙනවා නම් එදින මෙම අයවැය වාර්තාව සම්පූර්ණ වීම බැලිය හැකියි. ඒ අවස්ථාවේදී ප්‍රාදේශීය සභා වෙන් කිරීමෙන් ඇති වූ ප්‍රතිඵලය එම ජනතාව භුක්ති

විදිනවා ඇති. රජය විසින් අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කිරීමේදී ප්‍රාදේශීය සභා සඳහා වෙනම ප්‍රතිපාදන වෙන්කර ලබා දෙන්නේනම් ව්‍යාපෘති ඉටු කිරීම පහසු වේවි. ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් සඳහා එක්තරා ආර්ථික ව්‍යුහයක් සකස් කළ යුතුයි. දැනට වතුකරයේ ජනතාව වෙනුවෙන් සියළුම පක්ෂ එක්ව කටයුතු කරනවා. ඒ සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී දිගම්බරම් මැතිතුමාටත් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජීවන් තොන්ඩමන් මැතිතුමාටත් මාගේ ස්තුතිය පුදකරමි. එමෙන්ම අපි සහයෝගයෙන් යුතුව කටයුතු කළ යුතුයි. ලකම් ප්‍රදේශය සඳහා අතුරු ව්‍යවස්ථාවක් සකස් කරමින් එම ප්‍රදේශය ද ප්‍රාදේශීය සභාව යටතට පත්කළ යුතු බවට ප්‍රකාශ කරන අතර, බ්‍රවුන්ලෝ, නෝර්ටන් මාර්ගයේ පිහිටි වෙළඳ සැල් සියල්ල යම් ක්‍රමයක් මගින් ප්‍රාදේශිය සභාව යටතට පත් කිරීමට කටයුතු කළ යුතුයි. අනාගතයේදී වතුකරයේ සඳහන් සියළුම කරුණු ද ඇතුළත් කළ යුතුයි. එවිට මෙම පොතට වටිනාකමක් ලැබේවි.

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)</u>**

2023 වර්ෂයේ අයවැය වාර්තාව සකස් කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන සහ රජයේ ආයතනය කිහිපයක් සම්බන්ධ කර ගනිමින් සාකච්ඡා කර විශේෂ කාරණා කිහිපයක් එක් කර මෙම අයවැය වාර්තාව සකස් කර තිබෙනවා. 2018 වර්ෂයේ පෙබරවාරි 10 වන දින මෙම සභාවට මහජන නියෝජිතයෙක් වශයෙන් පැමිණ, 2023 වර්ෂයට අදාල අයවැය වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේදී මාහට කථා කිරීමට අවස්ථාව උදාවීම සම්බන්ධයෙන් සතුටු වෙනවා. මේ සඳහා අභාවප්‍රාප්ත අමාත්‍ය ගරු ආරුමුගන් තොන්ඩමන් මැතිතුමාට ස්තුතිවන්ත වෙමි. පක්ෂයේ වත්මන් සභාපති සෙන්දිල් තොන්ඩමන් මැතිතුමා, ප්‍රධාන ලේකම් ජීවන් තොන්ඩමන් මැතිතුමා, සභාපතිතුමිය, රාමේෂ්වරන් මැතිතුමා ඇතුළු ලංකා කම්කරු කොංග්‍රසයේ අනෙකුත් සාමාජිකයින් වෙත ද මාගේ ස්තුතිය පුදකරමි. අභාවප්‍රාප්ත අමාත්‍ය ආරුමුගන් තොන්ඩමන් මැතිතුමාගේ ප්‍රතිපාදන මගින් හෝ මුදල් ලේකම්ගේ ප්‍රතිපාදන මගින් හෝ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රාමේෂ්වරන් මැතිතුමාගේ ප්‍රතිපාදන මගින් හෝ ගරු සභාපතිතුමිය ගේ ප්‍රතිපාදන මගින් හෝ මාගේ කොට්ඨාශයට විශාල වැඩ කොටසක් ඉටු කර තිබෙනවා. වතුකරය සඳහා කොන්ක්‍රීට් මාර්ග සහ ආරක්ෂිත තාප්ප ඉදි කර තිබෙනවා. මෑතකදී මහන මැෂින් ද ලබා දුන්නා. මේ සියල්ලට මුල් වූයේ ගරු ආරුමුගන් තොන්ඩමන් මැතිතුමයි. 2023 වර්ෂය සඳහා වූ අයවැය වාර්තාව ඉතාමත් සාර්ථකව සකස් කර තිබෙනවා. මෙම වාර්තාවේ සඳහන් කරුණු ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම සඳහා මස්කෙළිය ප්‍රාදේශීය සභාව විසින් අවශ්‍ය කටයුතු සිදුකල යුතු යැයි ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී කේ.යෝගේන්ද්‍රන් මැතිතුමා (එ.ජා.නි.පෙ)</u>**

2023 වර්ෂය සඳහා වූ අයවැය වාර්තාව ඉදිරිපත් කර ඇති මෙම අවස්ථාවේදී මා හට මෙහිදී අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදුන් මාගේ කොට්ඨාශයේ ජනතාවටද, තරුණ තරුණියන්ට ද, අනෙකුත් කොට්ඨාශවල ජනතාවට ද මාගේ ස්තුතිය පුදකරමි. 2023 වර්ෂය සඳහා වූ අයවැය වාර්තාව සකස් කළ සභාපතිතුමිය, ලේකම්තුමා සහ කාර්යාලයේ අනෙකුත් නිලධාරී මණ්ඩලය වෙත ද මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමි. පසුගිය කාල වකවානුවේදී ආදායම වැඩි කරගැනීම සඳහා අප විසින් ඉදිරිපත් කළ යෝජනා ක්‍රියාත්මක කර තිබුණා නම් අයවැය වාර්තාවේ ආදායම් ශීර්ෂයන් වැඩි කරගැනීමට අවස්ථාව තිබුණා. මාවුස්සාකැලේ ප්‍රදේශයේ පිහිටි රාවණා ගල, ගාර්ට්මෝර් දිය ඇල්ල සහ බෝට්ටු සේවය ආදිය ආරම්භ කර ඒවා සංචාරක ස්ථාන වශයෙන් නම්කර වැඩසටහන් ක්‍රියාත්මක කරන්න තිබුණා. තවද සභාව ආරම්භ කර අවුරුදු හතරක් සම්පූර්ණ වී ඇතත් සභාවේ සේවකයින් සඳහා ස්ථිර පත්වීම් සභාව මඟින් ලබා දෙන්න බැරි වුණා. අනාගතයේ දී හෝ ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු කරන්න. තවද වතුකරයේ පුස්තකාල ආරම්භ කළයුතු බවට අපි ඉල්ලා සිටියා. ජංගම පුස්තකාල සේවාව ආරම්භ කිරීම සම්බන්ධයෙන් සභාවට මාගේ ස්තුතිය පුද කරමි. මස්කෙළිය නගරයේ පිහිටි

පුස්තකාලය දැනටමත් සංවර්ධනය කර තිබෙනවා. ඒ සඳහා ගරු සභාපතිතුමිය, ගරු මන්ත්‍රීවරුන්, ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයට මාගේ ස්තූතිය පුදකරමි. ඒ වගේම ආයුර්වේද රෝහල ද සංවර්ධනය කළ යුතුයි. අනාගතයේ දී පළාත් පාලන ආයතන වල සේවාව වතුකරයටත් දියත් කළ යුතුයි. කුඩා සභාවක් වුවද හැකිතාක් දුරට ව්‍යාපෘති සියල්ල අපි ඉටුකර තිබෙනවා. ඒ සඳහා සියළුම දෙනාට මාගේ ස්තූතිය පුදකරමි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**

මා ඉපදුනු මගේ ගමේ මට ඡන්දය ලබාදුන් ජනතාවටද, මාව මෙම සභාවේ නියෝජිතයෙකු වශයෙන් තෝරාපත්කර ගත් පක්ෂයේ නායකත්වයටත් ස්තූතිවන්ත වෙමින් මෙම අයවැය වාර්තාවේ විශේෂිත වැඩසටහන් මම දකින්නේ නැහැ. හේතුව අප විසින් ඉල්ලා සිටි කරුණු ප්‍රමාද වී ක්‍රියාත්මක කළ බව පසුගිය කාලවලදී දකින්න තිබෙනවා. පසුගිය වර්ෂයේ මන්ත්‍රීවරුන් වෙත ලබාදුන් ප්‍රතිපාදන මෙම අවුරුද්දේ මෙතෙක් ලබා දී නැහැ. එනිසා ජනතාවට අවශ්‍ය සේවාව ලබා දෙන්න බැරි වී තිබෙනවා. පසුගිය යහපාලන ආණ්ඩුව මඟින් නව ගම්මාන ඉදිකළා. එම ගම්මාන හෝ ප්‍රාදේශීය සභාව යටතට පත්කරගෙන වැඩසටහන් ක්‍රියාත්මක කළේ නම් ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන වියදම් කිරීමට සෘජුවම අවස්ථාව තිබුණා. මේවා විවිධ වාරවලදී අපි පවසා තිබෙනවා. වතු වලට වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාව සංශෝධනය කළ ද ඒ මාර්ගයෙන් ගමන් කිරීමට අපි පසුබට වෙනවා. මෙනිසා ජනතාව වෙත සේවාව ලබාදීමට නොහැකි වී තිබෙනවා. ගම්මාන සියල්ල වරිපනම් බදු අයකිරීමේ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කර එම ගම්මාන සඳහා ව්‍යාපෘති ලබාදිය යුතුයි. අංක 15 දරණ පළාත් පාලන ව්‍යවස්ථාව අවලංගු වුණා. එමඟින් කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කරන්න බැහැ. සභා සියල්ල විසුරුවා හැරීමේ අවස්ථාව ලං වී තිබෙනවා. දැනට අපගේ ජනාධිපතිතුමා විසින් සීමා මායිම් කමිටුවක් ස්ථාපනය කර තිබෙනවා. වතු ප්‍රදේශ සීමා මායිම් කිරීමේදී එම වතුවල ඉදිකළ නව ගම්මාන සඳහා ප්‍රාදේශීය සභාව මඟින් ප්‍රතිපාදන වෙන්කර ගත හැකියි. කමිටු හතරක් සඳහාවත් ප්‍රතිපාදන මධ්‍යම රජයෙන් ලබාදිය යුතුයි. එවිට ජනතාවට සේවාව ලබා දීමේ අවස්ථාව ලැබෙනවා. මෙම නීති වලට යටත්ව ඉදිරිපත් කර ඇති අයවැය වාර්තාව වැය ශීර්ෂ අනුමත කර ගැනීමේ යාන්ත්‍රණයක් වශයෙන් පමණයි මට දකින්න තිබෙන්නේ. නමුත් මෙවර ජනතා සංවිධාන ද සම්බන්ධ කරගනිමින් ඒ අයගේ උපදෙස් ද ලබා ගෙන එම කරුණු මෙම අයවැය වාර්තාවට ඇතුළත් කර තිබෙනවා. නමුත් මේ සියල්ල ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රතිපාදන සහයෝගය හෝ වෙන වෙනත් සහයෝගයක් නැති බවට මම අදහස් කරනවා. මේ සඳහා සම්පූර්ණ සහයෝගයක් ලබා ගැනීමට නම් මෙම නීති සංශෝධනය විය යුතුයි.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මෙහිදී අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබා දුන් මාගේ කොට්ඨාශයේ ජනතාවටද, එමෙන්ම මාව නියෝජිතයෙක් වශයෙන් තෝරා පත් කරගත් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මයිල්වාගනම් තිලකරාජ් මැතිතුමා ඇතුළු ද්‍රවිඩ ප්‍රගතිශීලී සන්ධානයේ සභාපතිවරුන් සියළු දෙනාටද ස්තූතිය පුද කරමි. 2023 වර්ෂය සඳහා වූ අයවැය වාර්තාව අළුත් වාර්තාවක් වශයෙන් තිබෙනවා. රාජ්‍ය නොවන සංවිධානයක උපදෙස් හා මඟපෙන්වීම යටතේ ඉතාමත් ක්‍රමානුකූලව සකස් කර තිබෙනවා. මෙම අයවැය වාර්තාවේ ප්‍රාදේශීය සභා ආඥා පනතේ සඳහන් නීති පද්ධති වලට අනුකූලව නිරීකිෂණය හැකි 09 වන 10 වන අයවැය වාර්තාවක් ලෙස මම නිරීක්ෂණය කර පැමිණ තිබෙනවා. මෙම අයවැය වාර්තා වේ එක්තරා වෙනසක් තිබෙනවා. එක්තරා රාජ්‍ය නොවන සංවිධානයක් අය වැය වාර්තාව සකස් කරන්නේ කෙසේද යන්න මගපෙන්වීමක් කර ඒ අනුව මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් මෙම අයවැය වාර්තාව සකස් කිරීම පිළිබඳව මෙම සභාවේ සභාපතිතුමිය, ලේකම්තුමා, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත ද මාගේ ස්තූතිය පුදකරමි. පළාත් පාලන ආයතනවල අයවැය වාර්තාව සකස් කිරීමේදී මතුවන ගැටළු

වලට විසඳුම් ලබා ගැනීම පිළිබඳව අපගේ පක්ෂ නායකයින් හෝ ජනතා නියෝජිතයින් ද ඉදිරිපත් නොවූ තත්වයක් දකින්න තිබුණා. ඒ අය මේ සඳහා වූ දැක්ම ඒ ආයතන වල සභාපතිවරුන්ට හෝ පරිපාලනය භාර ලේකම්තුමාට හෝ ලබා දී අපි ප්‍රශංසා කරන කරුණක් වශයෙන් ඔවුන්ගේ දේශපාලන බලය පවත්වාගැනීමට අපගේ නායකයින් මෙය අවස්ථාවක් කරගෙන තිබෙනවා. ජනතාවට අවශ්‍ය වැඩසටහන් ඉටු කරන්න යනුවෙන් පැවසීමට හෝ කිවහැකි අය සිටියේ නැහැ. පළාත් පාලන පනත සංශෝධනය කර වතුකරයේ ජනතාවත් පළාත් පාලන ආයතන වල නීති රීති අනුව ඇතුලත් කරගැනීමට අවස්ථාව ලැබෙන දවසට අපි ජනතා නියෝජිතයින් වශයෙන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වශයෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් සියළු දෙනාම සතුටට පත්වීමේ අවස්ථාවක් උදා වේවි. නමුත් 1987 අංක 15 දරණ පළාත් පාලන පනතේ 33 වන සංශෝධනයේ මෙම කරුණු එනම්, වතුකරයේ සංවර්ධනය ක්‍රියාත්මක වන අවස්ථාවේදී, සමාගම් සමග එක්තරා එකගතා ගිවිසුමකට පැමිණ ඒ අනුව වතුකරය සඳහා ප්‍රතිපාදන වෙන් කළ හැකි බවට පනතක් තිබියදී වුවද උඩපළාත ප්‍රාදේශිය සභාව වතුකරයේ ජනතාව සඳහා වතුර ටැංකි ඉදිකළ නිසා සභාව විසුරුවා හරින ලදී. අඹගමුව ප්‍රාදේශීය සභාවේ අපි සාමාජිකත්වය දරන කාල වකවානුව තුළ ප්‍රාදේශීය සභාවේ අයවැය වාර්තාවේ එක්තරා බලාපොරොත්තුවක් ලබාදී තිබුණද අයවැය වාර්තාවට බාහිරව විවිධ ව්‍යාපෘති එම සභාවේ සභාපති, ලේකම් සහ නිලධාරීන් මගින් අපි ඉටු කර තිබුණා. නමුත් 2018 වර්ෂයේ අංක 30 දරණ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කර, සංශෝධනය කළ පනතේ පිටපතක් 2009 වර්ෂයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයචන්ද්‍රන් මහතා මගින් අපට ලබාදෙන ලදී. එම පනත දෙමළ භාෂාවෙන් එක්තරා විදිහකට ද සහෝදර භාෂාවෙන් තවත් විදිහකට ද සකස්කර තිබෙනවා. විවිධ කරුණු මෙම පනතින් සංශෝධනය වී තිබෙනවා. පළාත් පාලන කොමසාරිස්, සහකාර කොමසාරිස්, පරීක්ෂණ නිලධාරී හෝ ගරු මන්ත්‍රීවරයකු වන මටත් ලබා දී ඇති පිළිතුර ජාතික තරුණ සේවා සභාවේ තරුණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ පොදු ක්‍රීඩා ක්ෂේත්‍රයක් ලබාදී තිබෙනවා. මාගේ ප්‍රතිපාදන මගින් එම වැඩසටහනට සංවර්ධන යෝජනාවක් ඉදිරිපත් කළ අවස්ථාවේ එම යෝජනාව ප්‍රතික්ෂේප වුණා. පළාත් පාලන කොමසාරිස්තුමා මගින් මෙම වැඩසටහනට වතු අධිකාරීවරයා ගේ ලිපිය ලදහොත් පමණක් ක්‍රියාත්මක කළ හැකි බවට පැවසුවා. මෙය ජනතාවට සේවාව ලබාදීමට බාධාවක් වුණා. මෙම යෝජනාව මා සැලසුම් කර ඉදිරිපත් කළා. කොළඹ දිස්ත්‍රික් ගරු මන්ත්‍රීතුමාගේ නායකත්වයෙන් දෙමළ ප්‍රගතිශීලී සන්ධානය, ලංකා කම්කරු කොංග්‍රසය ඇතුළු තවත් සිවිල් සංවිධාන විසින් සංවිධානය කළ එක්තරා සාකච්ඡාවක් පැවැත්වුණා. ජාතික වැඩසටහනකට වතුකරයේ ජනතාවත් ඇතුළත් විය යුතුයි යන්න එක්තරා වැඩසටහනක් ස්ථාපිත කිරීම සඳහා යෝජනාවක් ද ඉදිරිපත් කර තිබුණා. ඒ අවස්ථාවට නුවරඑළිය දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රාධා ක්‍රිෂ්ණන් මැතිතුමා ද ආචාර්ය විජයචන්ද්‍රන් මැතිතුමා ද අප කමිටුවේ සිටියා. ඒ අය සමඟ මේ පිළිබඳව කරුණු විමසූ අවස්ථාවේදී මෙම ව්‍යාපෘති ඉටුකිරීම සඳහා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ස්වකැමැත්තක් තිබිය යුතු බවට පවසනවා. සමහර වැඩසටහන් මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන මගින් ඉටු කළා. මේ සඳහා වූ ලේඛන ලබා ගැනීම සඳහා කෙතරම් දුක් වින්දාද කියන එක ලේකම්තුමා දන්නවා.

ගරු සභාපතිතුමියනි, ඔබතුමිය වතුකරයේ ජනතාව නියෝජනය කරන ප්‍රධාන පක්ෂයක ක්‍රියාකාරී සාමාජිකයෙකු වශයෙන්ද සභාවේ සභාපතිතුමිය වශයෙන්ද මෙම අයවැය වාර්තාව සඳහා නව මුහුණුවරක් ලබාදීම සම්බන්ධව මාගේ ප්‍රශංසාව පුදකර සිටිනවා. නමුත් ඔබතුමිය අප ඉල්ලා සිටින, උදාහරණයක් වශයෙන් පෙර පාසල් සභාව යටතට පත්කර ගැනීම වැනි කමිටු පිහිටුවා පෙර පාසල් 03ක් තෝරාගෙන පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලබා දී තිබෙනවා. ඉන් එකක්වත් ඉටුකිරීමට නොහැකි වුණා. විමධ්‍යගත අරමුදල් පමණක් සීමා කරගෙන කථා කරන්න බැහැ. අපි කුමන චෝදනාවක් ඉදිරිපත් කලත් මෙම කොලයට විරුද්ධව පමණක් ඉදිරිපත් කරනවා මිස ඔබතුමියට විරුද්ධව ඉදිරිපත් කරන්නේ නැහැ. විමධ්‍යගත අරමුදල් නැතිව

වතුකරයේ සංවර්ධනය සඳහා භාවිතා කලේ නම් මෙම අවස්ථාවේදී අපටත් සහයෝගයෙන් කටයුතු කිරීමට අවස්ථාවක් ලැබෙනවා. රාජ්‍ය නොවන සංවිධානයේ මග පෙන්වීම යටතේ මෙම අයවැය වාර්තාව ක්‍රමවත්ව සකස්කර තිබෙනවා. නමුත් මෙහි සඳහන්කර ඇති කරුණු වලින් අපගේ වතුකරය සම්බන්ධීකරණය කළ යුතු වෙනවා කියන එකයි අපගේ ඉල්ලීම.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මෙහිදී කරුණු දෙකක් ඉදිරිපත් කිරීමට මම බැදී සිටිනවා. එකක් මෙම අයවැය වාර්තාවේ සභාව වෙත ආදායම ඉපයීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අපි පවසා තිබුණා. ඉන් සමහරක් පිළිබඳ අවධානය යොමු කිරීමට අපි බැහැර වී තිබෙනවා. ඒ සඳහා කනගාටුව ප්‍රකාශ කරන අතර, මෙම සභාව ආරම්භ කර අවුරුදු හතරක් පුරාවට සභාව විසින් ඉටුකළ සියළු හොඳ කාර්යයන් සඳහා මේ අවස්ථාවේදී ස්තුතිය පුදකරමි. සභාවේ සභාපතිතුමිය, උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරුන්, ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයට මගේ ස්තුතිය පුදකරමි.

**<u>ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)</u>**

මෙම අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කිරීම සඳහා මා හට අවස්ථාව ලබාදුන් මෙම සභාවට මාගේ ස්තුතිය පුදකර සිටිමි. පසුගිය අවුරුදු පහක කාල වකවානුව තුළ සභාව මඟින් විවිධ සේවාවන් ඉටුකර තිබෙනවා. වීදි ලාම්පු සවිකර තිබෙනවා, කොවිඩ් කාලෙට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. කියවීම් මාසය නිමිත්තෙන් පාසල් ළමුන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. වතුකරය සඳහා සෘජුවම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බාධාවන් තිබෙනවා. උදාහරණයක් වශයෙන් වතු පරිපාලනය සඳහන් කළ හැකියි. තමන්ගේම වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා වුවද වතු අධිකාරීවරයා ගේ නිර්දේශ ලිපියක් ලබාදිය යුතුව තිබෙනවා. ඒ නිසා වතු කරය සඳහා සම්පූර්ණයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපි උත්සුක විය යුතුයි. මෙම අයවැය වාර්තාව තුළ අපගේ ජනතාවට යම් සහන කරුණු ටිකක් අන්තර්ගතව තිබෙනවා. මෙම සභාවට මාව ඡන්දයෙන් තෝරා පත් කරගත් මාගේ තඹේතැන්න කොට්ඨාශයේ ජනතාවටද කඳුරට ජනතා පෙරමුණ පක්ෂයේ නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රාධාක්‍රිෂ්ණන් මැතිතුමාට ද මාගේ ස්තුතිය පුදකරමි.

**දීර්ඝ සාකච්ඡාවකින් පසුව මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා වූ අයවැය වාර්තාව ඡන්දය විමසීම සඳහා යොමු කරන ලදී.**

**<u>ඡන්ද විමසීම පිළිබඳ විස්තර :-</u>**

**පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරුන්ගේ විස්තර**

01. ගරු සභාපති ජී. සෙන්බගවල්ලි මැතිණිය.
02. ගරු උප සභාපති පී. පී. ප්‍රදීපන් මැතිතුමා.
03. ගරු මන්ත්‍රී කේ. රාජ්කුමාර් මැතිතුමා.
04. ගරු මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා.
05. ගරු මන්ත්‍රී කේ. නිත්‍යානන්දන් මැතිතුමා.
06. ගරු මන්ත්‍රී එස්. සුරේෂ්කුමාර් මැතිතුමා.
07. ගරු මන්ත්‍රී ටී. වසන්තකුමාර් මැතිතුමා.
08. ගරු මන්ත්‍රී ඒ. රවීන්ද්‍රරාජා මැතිතුමා.
09. ගරු මන්ත්‍රී කේ. යෝගෙන්ද්‍රන් මැතිතුමා.
10. ගරු මන්ත්‍රිනි. කේ. එල්. ඒ. රංජනී මැතිතුමිය.
11. ගරු මන්ත්‍රිනි. කේ. ජී. කේ. පෙරේරා මැතිතුමිය.
12. ගරු මන්ත්‍රී එස්. ඒ. දිසානායක මැතිතුමා.

**විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරුන්ගේගේ විස්තර**

01. ගරු මන්ත්‍රී කේ. සුරේෂ්කුමාර් මැතිතුමා.
02. ගරු මන්ත්‍රී පී. රාජ්කුමාර් මැතිතුමා.
03. ගරු මන්ත්‍රී එස්. සුබ්‍රමනියම් මැතිතුමා.

**නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ විස්තර**

01. ගරු මන්ත්‍රී පී. ආනන්දරාජ් මැතිතුමා.

**තීරණ අංක 17**
2023 වර්ෂය සඳහා වූ අයවැය යෝජනාව පිළිබඳ ඡන්දය විමසීමේ දී වැඩි ඡන්ද නවයකින් 2023 වසර සඳහා වූ අයවැය සභා සම්මත විය.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
2023 වර්ෂය සඳහා වූ අයවැය යෝජනාව සඳහා සහයෝගය ලබාදුන් සියළු දෙනාටම මාගේ ස්තුතිය පුද කරමි.

**06 . යෝජනා**

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මීළඟට ගරු මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මාගේ යෝජනාව වන්නේ ශ්‍රී පාද වන්දනා සමයේදී එහි පැමිණෙන බැතිමතුන් සඳහා අවශ්‍ය සුහසාධන කටයුතු ලබාදීම සම්බන්ධයෙනි. සෑම අවුරුද්දකම මා විසින් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් එය ඉටු නොකිරීම අවාසනාවන්ත තත්වයක්. ගිනිගත්හේන සිට සමන් දේවාලය දක්වා පැමිණෙන බැතිමතුන් සඳහා අඹගමුව ප්‍රාදේශිය සභාව විසින් කිරිවන්එළිය ප්‍රදේශය දක්වා සුභසාධක කටයුතු ලබාදී තිබෙනවා. නමුත් එම ප්‍රදේශයේ සිට සමන් දේවාලය දක්වා කිසිම පහසුකමක් සකස්කර ලබා දී නැහැ. මේ සම්බන්ධයෙන් බොහෝ ස්ථාන වල දී මම දැනුම් දී තිබෙනවා. එනිසා 2023 වසරේ දී හෝ වැසිකිළි, නානකාමර සහ වෙනත් පහසුකම් ලබා දිය යුතුයි. එමෙන්ම, ශ්‍රීපාදස්ථාන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිතය වැඩිවී තිබෙනවා. ආරක්ෂක අංශ සමග එක්ව කටයුතු කරමින් එයද මර්දනය කිරීමට කටයුතු කළ යුතුයි. තවද මාර්ගය සම්බන්ධවත් සඳහන් කළ යුතු වෙනවා. මාර්ග ඉතාමත් අබලන් තත්වයේ පවතිනවා. එනිසා මෙම මාර්ග අළුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුයි. එමෙන්ම එම ප්‍රදේශයේ පොලිතීන් භාවිතය තහනම් කිරීම සඳහා දැනුවත් කළ යුතුයි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
ගරු මන්ත්‍රීතුමා, මාර්ගය සම්බන්ධව කතා කර තිබුණා. ගිනිගත්හේන සිට මේ දක්වා ඇති මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා පසුගිය 8 වැනිදා සිදුකළ කමිටු රැස්වීමේදී එකගතාවය පළ කළා. නැවතත් අපි ඒ සම්බන්ධයෙන් කතා කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යෝගේන්ද්‍රන් මැතිතුමා (එ.ජා.නි.පෙ)**
ශ්‍රී පාද වන්දනා සමයේදී මවුස්සාකැලේ හන්දියේදී වාහන තදබදයක් ඇති වුවහොත් එම වන්දනා පිරිස යටිතල පහසුකම් ලබා ගැනීම සඳහා බොහෝ දුෂ්කරතාවලට මුහුණ දෙනවා. ඒනිසා ඒ සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගන්නවානම් වඩාත් සුදුසුයි.

## 07. අනෙකුත් කරුණු, විශේෂ දැනුම්දීම් සහ ඉදිරි සභා රැස්වීම සඳහා දිනය දැනුම් දීම

ගරු මන්ත්‍රී එස්. සුරේෂ්කුමාර් මැතිතුමා විසින් ශ්‍රී පාද වන්දනා සමය හා මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව කරුණු දක්වන ලදි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
මේ සමඟ අද දින සභා කටයුතු සාමකාමීව පවත්වාගෙන යාම සඳහා සහයෝගය ලබා දුන් ඔබ සැමට ස්තූතියි. මෙයින් සභා රැස්වීම් කටයුතු අවසන් කරමි.

ස්තූතියි.
ආයුබෝවන්.

සභාපති,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.

ලේකම්,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.